# අගනුවර සිට රජ රටට



හත් අට මසක් ගියමුත් විත් රජ රටට
හත් අට දිනක් මෙනි දැණුනෝ මගෙ සිතට
නෙත් පිනවන දසුනක් ඇත මේ අවට
කෙත් වතු පිටි වලින් දෙයි සැනසුම සිතට

පැරකුම් රජ දවස දියුණුව මෙනෙහි කොට
කැටයම් ළඟට ගොස් කාලය ගෙවන විට
ලොවදම් පිළිබඳව දසුනක් මැවෙයි මට
එතරම් සැනසුමක් නොලදිමි කිසිම විට

එදවස ගාලු මුවදෙර වෙරළේ ඇවිද
ගත කළ දිවිය ඇතිමුත් මතකෙහි සුහද
පැරකුම් සමුදුරෙහි වැව් බැම්මෙහි ඇවිද
නිදහස් සුවය විඳ සැනසිය හැකි නොවෙද

සංකර ගති වලින් පිරි නගරයක — ණයත් ලබා
අප හුරු සතුට ලද හැක්කේ කවර — ත්ත්ව
රජරට ගොවි දනගෙ හදවත් තුලට — බට
එක් මොහොතකින් එය ලැබ ගත හැකිය — මට

සුවිසල් මැදුරු කුමටද ගම උපන් — මට
මහ උයනක සිරිය ඇත පලු ගසක් — යට
ගොවි දහඩියෙන් බිහිවූ මුතු මැණික් — කැට
ගෙන සැරසිය හැකිය මගෙ හද මැදුර — මට

මුළු රට වගා සටනක පෙරමුණෙක — දිවෙයි
එහි හඬ බැලූ බැලූ හැම පෙදෙසෙකින් — ඇසෙයි
රජරට ගොවි දනන් එහි නියමුවන් — තමයි
ඔවුනගෙ දහඩියෙන් රන්වන් කරල් — පැසෙයි

යල කන්නයේ අස්වනු දුන් නෙලනු — පෙනේ
ගොවි දන මින පුබුදු කරවන බවක් — දනේ
මහවැසි සමග සැනසුම ගොවි දනට — ගෙනේ
දුර නැහැ වගා සටනින් ජය ලබන — දිනේ

මහවැලි කුමරි රජරට එන දිනය — ළඟයි
එදවස යළිත් මෙපෙදෙස ජය කෙහෙළි — නගයි
රජරට අද යනුයෙ යා යුතු නියම — මඟයි
එහි අරමුණ වනුයෙ රට සරු කරන — වගයි

වැසි ලැබ කලට හැම කෙත් වතු — සරුවේවා
නිවහල් දයක නිවහල් පල — බිහිවේවා
රජරට තුළින් යළි දියුණුව — ඇතිවේවා
මා—ඔබ අපේ රට—දය ඉන් — පිබිදේවා.

ඩී. එස්. හපුතන්තිරි ගෙතී.